# G.O.B.A. Rest- කතරගම නිවාඩු නිකේතනය

## නවාතැන් ලබා ගන්නා අමුත්තන් සඳහා වන උපදෙස්

1. **1.1.** එක් එක් කාමර වල නවාතැන් ගත හැකි සංඛ්‍යාව ලදුපතේ සඳහන් කර ඇත. එම සංඛ්‍යාවට වඩා නවාතැන් ගැනීමට කැඳවා ගෙන නොපැමිණිය යුතු බව අවධාරණය කරමි. වෙන් කල දින ප.ව **1.00** නිකේතනයට ඇතුල්විය හැකි අතර අවසන් දින පෙ.ව **11.00**ට පෙර ආපසු කාමරය භාර දිය යුතු වේ.
   1.2. නියමිත සංඛ්‍යාවට වඩා නවාතැන්ගත් විට අයකල යුතු ගාස්තු ප්‍රමාණය පහත දැක්වේ. දෙදෙනෙකුට වඩා වැඩිපුර නවා තැන් ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

| වර්ගය | | කාමර අංක | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1,2,4,5,6 | | 03 | | 07 | | 08 | | 09 | | 10 | |
| | | නිවාස | | නිවාස | | කාමර | | කාමර | | කාමර | | කාමර | |
| නවාතැන් ගත හැකි උපරිමය | | 4 | | 6 | | 4 | | 6 | | 10 | | 12 | |
| අමතර නවාතැන්කරුවන් සඳහා ගාස්තු | අවු: 12 අඩු | 01 | - | 01 | - | 01 | - | 01 | - | 01 | - | 01 | - |
| | අවු: 12 වැඩි | 01 | 02 | 01 | 02 | 01 | 02 | 01 | 02 | 01 | 02 | 01 | 02 |
| අමතර ගාස්තු | | 500.00 | 875.00 | 450.00 | 750.00 | 350.00 | 575.00 | 250.00 | 310.00 | 200.00 | 300.00 | 200.00 | 300.00 |

2. කාමර හෝ යුගල නිවාස ලබා ගැනීම සඳහා ගෙවනු ලබන මුදල් කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. සාමාජිකත්වය සඳහා වන සහන ගාස්තු මත කාමර වෙන්කර ගත් සාමාජිකයින් නවාතැන් ගැනිම සඳහා පැමිණීම අත්‍යාවශ්‍ය වන අතර එසේ නොපැමිණෙන අවස්ථා වලදී ඒ සඳහා ඉදිරිපත් වන අයගෙන් සාමාජිකයන් නොවන පුද්ගලයන්ගෙන් අයකරන කාමර ගාස්තුව දක්වා වන ශේෂ මුදල අදාල ස්ථානයේදීම ගෙවිය යුතුය.
3. වෙන් කිරිම් වෙනස් කිරිමට එක් අවස්ථාවක් පමණක් ලබා දෙන අතර එය මුල් වෙන් කිරිමේ සිට වසරක් ඇතුලත දිනයක් විය යුතුයි.වැඩ කරන දින **05** කට පෙර මුල් වෙන් කිරිමේ වෙනස් කිරිමක් සිදු කිරිමේදී අමතර ගාස්තු අය නොකරන අතර වැඩ කරන දින **5**කට අඩු වන අවස්ථාවලදී පහත සඳහන් පරිදි අමතර ගාස්තු අය කරනු ලැබේ.
   A. වැඩ කරන දින **05**ක් ඇතුලත සිදු කරන වෙනස් කිරිමකදී ගෙවිය යුතු මුදලින් **25%**
   B. වැඩ කරන දින **03**ක් ඇතුලත සිදු කරන වෙනස් කිරිමකදී ගෙවිය යුතු මුදලින් **50%**
4. නවාතැන් කරුවන්ට අවශ්‍ය ආහාර හා තේ නිවාඩු නිකේතනයෙන් කළමනාකරුට දන්වා සකස් කරවා ගත හැක. එසේ ලබා ගන්නා ආහාර සඳහා අපගේ මිල ගණන් අනුව නිකේතනයෙන් පිටත් වීමට පෙර නිකේතන කළමණාකරුට මුදල් ගෙවා ලදුපතක් ලබා ගත යුතුය.
5. අවශ්‍යවේ නම් සාමාජිකයන්ට පමණක් ආහාර පිස ගැනීමට පහසුකම් සලසා ඇත. ඒ සඳහා අවශ්‍ය ගෑස්/ජලය/විදුලිය හා අනෙකුත් ආම්පන්න සඳහා එක් අයෙකු වෙනුවෙන් එක් වේලක් සඳහා රු.**50.00** බැගින් අයකරනු ලැබේ.
   (නවාතැන් ගාස්තු වලට අමතරව අයකරනු ලබන මෙම අයකිරිම් ගෑස්, ජලය , විදුලිය , ආම්පන්න සැපයීම පදනම් කරගෙන නියම කර ඇති බව කරුණාවෙන් සැලකුව මැනවි)
6. ආහාර පිසිම කල යුත්තේ ඒ සඳහා වෙන් කර ඇති මුළුතැන්ගෙයි පමණි.කිසිදු හේතුවක් මත ද්විත්ව නිවාසයක හෝ කාමරයක් තුල හෝ ආහාර පිසීම නොකල යුතුයි. එසේම නවාතැන් ගන්නා ස්ථානය තුල විදුලි උපකරණ උපයෝගී කරගෙන අනවසර කටයුතු කිරිමටද ඉඩදෙනු නොලැබේ. තේ හෝ ආහාර පිස ගැනීම නිකේතන කාමර තුල සිදු කලහොත් රු. **1,000/-** ක දඩයක් නියම කරනු ඇත.
7. නවාතැන්කරුවන් වෙත නිකුත් කරනු ලබන කාමර වල යතුරු නවාතැනෙන් ඉවත්ව යන විට නිවාඩු නිකේතන කළමනාකරුට භාරදිය යුතුවේ. යම් හෙයකින් අදාල යතුර නැති වුවහොත් ඒ සඳහා රු.**500/-**ක මුදලක් අයකරනු ලැබේ. (මෙම මුදල අයකරනුයේ දොරේ සම්පූර්ණ අගුල අළුතින් දැමීමට සිදු වන හෙයිනි) සාමාජිකයෙකු නොවන නවාතැන්කරුවකු නම් නිකේතන පරිශ්‍රයෙන් පිටවීමට පෙර මෙම සියළු මුදල ගෙවිය යුතුය. තවද වෙනත් අලාභහානියක් සඳහා කළමණාකරු නියම කරනු ලබන මුදල් ගෙවිය යුතු බව සැලකුව මැනවි.
8. නිකේතන පරිශ්‍රය තුල වාහන සේදීමට අවසර /ඉඩ දෙනු නොලැබේ.
9. නිකේතනයට රැගෙන එන ඔබේ බඩු බාහිරාදිය ප්‍රවේශම් කරගැනීම ඔබ සතු වගකීමකි. එම බඩුබාහිරාදිය සම්බන්ධයෙන් කළමනාකාරීත්වය කිසිදු වගකීමක් දරනු නොලැබේ.
10. නිකේතන පරිශ්‍රය තුල මත්පැන් පානය කිරිම හා ගෙන ඒම සපුරා තහනමිය.
11. නවාතැන්කරුවන් අන්අයට හිරිහැර වන සේ හැසිරිම නොකල යුතුය.
12. නවාතැන්කරුවන් විසින් ආහාර සකස් කරන විට නවාතැන් ගෙන සිටින පිරිසට අමතරව වැඩිපුර ආහාර සකස් කිරිමට ඉඩ දෙනු නොලැබේ. (දාන හෝ දන්සැල් සඳහා ආහාර සකස් කිරිමට ඉඩ දෙනු නොලැබේ.)
13. නවාතැන්කරුවන් රාත්‍රී **10.30** ට පෙර වෙන් කර ගත් කාමර හෝ යුගල නිවාස වලට පැමිණිය යුතුය.
14. මෙම උපදෙස් උල්ලංඝනය කරමින් කටයුතු නොකල යුතු අතර,මෙම උපදෙස් වලට පටහැනිව කටයුතු කරන්නන් සම්බන්ධයෙන් නිවාඩු නිකේතන කළමණාකරුගේ වාර්තාව මත වැඩිදුරටත් ක්‍රියා කිරිමට සිදු වන බව අවධාරනය කරමි.

අ.කලේ / එන්.ඒ.ඒ.එච්.නිශ්ශංක
ලේකම් හා ගණකාධිකාරි
ර.නි.ය.ස .සංගමය

G.O.B.A. Rest
දු.ක -: **047-2236045**

ඉහත සඳහන් කරුණු වලට එකඟව කතරගම G.O.B.A. Rest හි නවාතැන් ගැනීමට එකඟ වෙමි.

............................................ .................................................................. ............................... ..........................................

දුරකථන අංකය නවාතැන්කරුගේ නම දිනය නවාතැන්කරුගේ අත්සන